# හොරුන්ට ආවඩන රටක්

පටබැඳිගේ දේවේන්ද්‍ර



මනෝ පුබ්බංගමා ධම්මා *
මනෝ සෙට්ඨා මනෝමයා
මනසා චේ පදුට්ඨේන *
භාසතිවා කරෝතිවා *
තතෝ නං දුක්ඛමන්වේති *
චක්කංව වහතෝ පදං

සිත සිතිවිලි වලට පෙරටුවේ. සිත සිතිවිලි වලට ශ්‍රේෂ්ඨවේ. සිතිවිලි සිතින්ම උපදී. ඉතින් යමෙක් කිලිටි සිතින් යමක් කරයි නම් හෝ වේවා කියයි නම් ඒ හේතුවෙන් ගොනාගේ පය අනුව යන කරත්තය රෝදය-මෙන් දුක ඔහු පසු පස ලුහු බඳී. ලලිත් වීරතුංග සහ අනූෂ පැල්පිට සිපිරි ගෙදර උලු ගනිද්දී, මෙනෙහි කරන්නට ඉතිරි වී තිබුනේ ඉහත ගාථා පාඨයයි.

මා දන්නා පරිදි ඔවුන් හිරේ ගියේ රෙද්දක් බෙදූ නිසාය. මෙහි ඇති බැරෑරුම්ම කාරණය, එය නිකම්ම නිකම් රෙද්දක් නොවී සිල් රෙද්දක් වීමය. ඒ නිසා සිල් රෙද්දක් බෙදීම වරදක් වන්නේ කොහො මදැයි, මේ මගඩියට ගෙඩි පිටින් සම්බන්ධ හිටපු ජනපතිවරයෙක් ඇසීය. හොඳයි, මේ රෙද්ද සිල් රෙද්දක් නොවී චිත්ත රෙද්දක් හෝ සරොම් රෙද්දක් වී නම් එය වරදක් විය හැකිව තිබුණෝ ද? නොඑසේ නම් මේ රෙද්ද සිල් රෙද්දක් නොවී, ළිඳේ නානවිට ඇග වටේ ඔතන දිය රෙද්දක් ලෙස පාවිච්චි කළේ නම් එය වරදක් විය හැකිව තිබුණෝ ද?

"ඔබට රාජාලියෙක් වීමට අවශ්‍යවන්නේ නම් පාත්තයන් සමග ගමන් නොකළ යුතුයැයි" මා අසා ඇත.

ලලිත් වීරතුංග නම් වූ හිටපු ජනාධිපති ලේකම්වරයා පාත්තයන් එකෙක් සමග නොවේ, රංචුවක් සමග නොකල්හී ඉතා දුර ගමනක් ගියේය. ඔහු රාජ්‍ය සේවයේ මාණ්ඩලික නිලධාරියෙකි. අපේ රටේ රාජ්‍ය සේවකයා ද යැපෙන්නේ පුරවැසියා විසින් පත්කරගන්නා ලද ධනපති ආණ්ඩුව, එකී පුරවැසියාවම පසුව යටත් වැසියෙකු බවට පත් කර, පරිපීඩනයට ලක් කරමින් රැස් කර ගන්නා බදු මුදලෙනි. එවන් මුදලින් යැපෙන ඇත්තෝ වහ වහා තම යුතුකම ඉටු කළ යුත්තෝය. ලලිත්-අනූෂ පැහැර හැරියේ එයයි.

ජනතා විමුක්ති පෙරමුණේ වසන්ත සමරසිංහ, දූෂණ විරෝධී පෙරමුණ හරහා ඔවුන්ට එරෙහිව නඩු පැවරූයේ මේ නිසාමය. වසන්ත තැබූ ඒ කුඩා පිම්ම ජවිපෙට පක්ෂ*විපක්ෂ සකලවිධ ජනතාව වෙනුවෙන්ම තැබූ යෝධ පියවරක් බව ලියුම්කරු දකින්නේ එය එතරම්ම කාලෝචිත නිසාය.

කෙසේ වුවත්, හෙණ කඳන් සේ හතර වටේට දසන් විලිස්සමින් බන්ධනාගාරයට පිය නැගූ ලලිත් අනූෂ දෙපල, හැරෙන තැපෑලෙන්ම මළ කඳන් නාටකයට පන පොවා බන්ධනාගාර රෝහලට රිංගූ හැටි රටම දැක්කේය. කණින් කොණින් ඇසෙන ආරංචි ද පැවසූයේ බන්ධනාගාර රෝහලේ නිර්මලී තේනුවරට මසකට රු. දස ලක්ෂයක අල්ලසක් ඒ සඳහා ඒකා-බද්ධයෙන් ලබා දුන් බව ය.

එකී මෙකී අලකලංචි මැද්දේ මහින්ද රාජප-ක්ෂගෙන් ඒහි භික්ෂුභාවය ලත් පැවිද්දන් කිහිප දෙනෙකු  අධිකරණයෙන් නියම කළ දඩ සහ වන්දි මුදල පිණ්ඩපාත කිරීමෙන් එකතු කර දීමට ඉදිරිපත් වීම කැපී පෙණුනි. වස් කාලයේ පිණ්ඩපාතයේ යාමක් ගැන මා මේ ඇසුවාමය. එය රාජපක්ෂ නිකායට පමණක් පොදු දෙයක් වන්නට ඇත. පිඩු සිගන්නේද මුදල්ම පමණි. ගිහි මා දන්නා පරිදි එය බුද්ධ දේශිතය නොවුණාත්, රාජපක්ෂ නිකායේ මුණිවරයෙකු දෙසූ දහමක් විය යුතුය. නොදුන් දේ ගැනීමෙන් වැළකීමේ ශික්ෂා පදය පංච ශීලයෙන් එක් සිල් පදයකි. එය කඩ කිරීම නීතියට අනුව ද වරදකි. එවැනි අපරාධයක් කළ අයවළුන් වෙත සමාජ ගෞරවයක් ලබා දීමට දත කන්නේ ගිහියන් පන්සිල් ගන්වන මහණුන් පිරිසක් වීමෙන්ම රාජපක්ෂ දශකය පුරා බුද්ධ ශාසනයට සිදුවූ පරිහාණිය මොනවට පෙන්වා දෙයි.  භික්ෂු වෙස් ගත් කොල්ල කරුවන් සිය සුඛ විහරණයට අමතරව තමන් පයුරු පාසනය කරන චෞරයන් බේරා ගැනීමටද ගිහියන් ගොනාට ඇන්දවීම කෙතරම් ශෝචනීයයිද?

ලියුම්කරු මේ ලියන අවස්තාව වන විටත් වසර 3 ක් සිරගෙට නියම වූ ලලිත් - අනූෂ දෙපලට, යස අගේට ඇප නියම වී ඇත. එහෙත් බඩගින්නට පොල් ගෙඩි දෙකක් සොරකම් කළ, පහළ අපේ පංතියේ සිරිපාල හෙටටත් සිර කුටිය තුළ හිරවී වසර දෙකේ සිර දඬුවම ගෙවෙන තුරු ජේලර්ගේ ගෙම්බර් බලනු ඇත.

සත්‍ය වශයෙන්ම රටේ මේ අපායට වග කිව යුත්තේ දේශපාලකයන් පමණක්ම නොවේ. වසර 70ක් පුරාවට එජාප, ශ්‍රීලනිප නම් වූ මඩ වලවල් දෙකට මාරුවෙන් මාරුවට පනිමින්, එකකින් බේරෙන්නට අනිත් මඩ වලට පනිනු ලැබූ ඔබත් ඔබත් එයට වග කිව යුතුමය. ඒ පවින් මිදෙන්නටනම්, කුණු වී ගඳ ගසන ප්‍රධාන පක්ෂ දෙකම, සැබවින්ම දෙකක් නොව එකක් බව තේරුම් ගත යුතුමය. පසු ගිය කාලය පුරාවටම තමන්ට මහත්මා දේශපාලනයක නිරත විය හැකි බව ඔනෑවටත් වඩා ඔප්පු කළ පිරිසක් වටා රැස් වෙමින්, විකල්පයක් සෙවීම උදෙසා සමාජය බලමුළු ගැන්වීමට එකා මෙන් එක්විය යුතුය.

**ලියුම්කරු මේ ලියන අවස්තාව වන විටත් වසර 3 ක් සිරගෙට නියම වූ ලලිත් - අනූෂ දෙපලට, යස අගේට ඇප නියම වී ඇත. එහෙත් බඩගින්නට පොල් ගෙඩි දෙකක් සොරකම් කළ, පහළ අපේ පංතියේ සිරිපාල හෙටටත් සිර කුටිය තුළ හිරවී වසර දෙකේ සිර දඬුවම ගෙවෙන තුරු ජේලර්ගේ ගෙම්බර් බලනු ඇත.**